

## කල්පිටියේ දෙව්මැදුරු පුරාණය

සාගර ජයසිංහ





# *Santhanadeepaya*

Heritage Catholic Churches of the Kalpitiya Peninsula

By

*Sagara Jayasinghe*

**Abstract**

This is a historical and an architectural survey of the heritage Catholic churches in the Kalpitiya peninsula located in north-western province of Sri Lanka.

Chapter One – The significance of Architecture in the institutional growth of Catholicism
A discussion on the origin of the Catholic Church, its historical unfolding and institutional growth of the Catholicism in the Kalpitiya peninsula is discussed.

Chapter Two – Architectural evolution of St. Anne's Shrine, Talawila
An analysis of the historical evolution of art and architecture of the St. Anne's Shrine, the focal point and the centre of devotion of the peninsula.

Chapter Three – Exploring diversity
The focus herein is on the architectural designs, diversity and history of other important churches in the peninsula.

# පටුන



| | |
|---|---|
| පෙරවදන | 01 |
| හැඳින්වීම හා අනුමෝදනාව | 05 |
| කල්පිටියේ සිතුවු පුරාණය | 09 |
| තලවිල සන්තානා පුදබිම | 27 |
| සන්තානාදීපයේ අද දවස | 49 |
| පරිශීලිත ග්‍රන්ථ | 87 |


1

# කල්පිටියේ කිතුනු පුරාණය

ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම් රටාවත්, දේශපාලනමය, සාමාජීය හා සංස්කෘතිකමය පසුබිමත් අධ්‍යයනය කිරීමේදී එහි වයඹ දිගින් පිහිටා ඇති කල්පිටිය අර්ධද්වීපයට හා ඒ අවට භූමි ප්‍රදේශයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. එසේම ඒ ප්‍රදේශය ශ්‍රී ලංකාවත්, ඉන්දියාවත් අතර වෙළෙඳ සම්බන්ධතා පවත්වා ගැනීමට ඉවහල් වූ ඉතා වැදගත් කේන්ද්‍රස්ථාන වලින් එකක් ලෙසද හැඳින්විය හැකිය. දුටුගැමුණු රාජ්‍ය සමයේදී මුතු කර්මාන්තය ආශ්‍රිත වෙළෙඳාම් කටයුතු කල්පිටිය, හලාවත හා උරුවෙලා යන පැරණි වරායන් මුල් කරගනිමින් සිදු කළ බව සඳහන් වන අතර කල්පිටි මුහුදු තීරයෙන් මුතු ලැබුණු බවද වංශ කථා සඳහන් කරයි. 16 වන ශත වර්ෂයේ සිට බටහිර අධිරාජ්‍යවාදීන්ගේ දැඩි බලපෑම්වලට ලක්වූ හලාවත, කල්පිටිය හා පුත්තලම ප්‍රදේශ ඔවුන්ගේ වෙළෙඳ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ප්‍රබල මධ්‍යස්ථානයක් ලෙසින් භාවිතා කරන ලදී.

ශ්‍රී ලංකාවට පෘතුගීසින් පැමිණීමටත් පෙර සිට මෙරට ජනයා අතර කිතු දහම ප්‍රචලිතව පැවති බවට ඉතා පැහැදිලි සාක්ෂි හමු වී ඇත. ඔස්වල්ඩ් ගෝමිස් විශ්‍රාමික අගරදගුරුතුමාගේ ලේඛන වලට අනුව කිතු දහම ලක්දිව රෝපණය වන්නේ ක්‍රි. ව. 40 දී පමණ ශුද්ධ වූ තෝමස් මුනිවරයාගේ පැමිණීමත් සමගය.




කල්පිටිය ප්‍රදේශය ආශ්‍රිත
ඉපැරණි වරාය වෙළෙඳ මධ්‍යස්ථාන




# 2

# තලවිල සන්තානා පුදබිම

තලවිල ශා. ආනා සිද්ධස්ථානයේ ආරම්භය පැහැදිලි ලෙසින්ම මෙසේ සිදුවිනැයි පැවසීම අපහසු වුවත්, එහි ආරම්භය පිළිබඳව කියැවෙන මුඛ පරම්පරාගත පුරාවෘත්ත දෙක අතරේ බොහෝ සමානකම් ඇත. එම පුරාවෘත්තයන්ට අනුව 17 වන සියවසේ අග භාගයේදී තලවිල වෙරළ තීරයට නුදුරුව එක්තරා ප්‍රතිකාල් නෞකාවක් මුහුදුබත් වී ඇත. එම නෞකාව තුළ තිබූ ශුද්ධ වූ ආනා මුනිවරියගේ කුඩා ප්‍රතිමාව ගොඩබිමට ගෙනඒමෙන් අනතුරුව මෙම සිද්ධස්ථානයේ ආරම්භය සිදු වී ඇත. කල්පිටිය ග්‍රාමය  පුරාණ කාලයේදී "අරසාරි"  හෙවත් 'අරසාඩි' යන නමින් හඳුන්වන ලද අතර 'අරසාඩි' නමැති දෙමළ වචනයේ අර්ථය නම් 'අරසු' හෙවත් "නුග රුක අසල පිහිටි ග්‍රාමය" යන්නයි. මෙයින් අදහස් වන්නේ පුරාණයේ පටන් මෙරට ජනජීවිතය හා බැඳුණු නුග රුක් සඳහා මෙම ප්‍රදේශය තෝතැන්නක් වූ බවයි. ගොඩබිමට ගෙනඑන ලද මෙම ප්‍රතිමාවේ ප්‍රථම ආරක්ෂක ස්ථානය වී ඇත්තේද, දැනට සිද්ධස්ථානය පිහිටි භූමියේ එදා තිබූ මෙවැනි විශාල නුග වෘක්ෂයක් බව පුරාවෘත්ත දෙකෙහිම අවසානයෙන් කියැවේ.

*"...ශු. ආනා වහන්සේගේ කෞතුක ප්‍රතිමාව වැඩම වූ පළමුවන ලැහැබ නම් නුග ගසක ස්වභාවයෙන්ම සැදුණු කුහරයකි. ඉන්පසු මනුෂ්‍ය දෑතින් තනන ලද අතු පැලක්ද, මැටි ගෙයක්ද පූජනීය ප්‍රතිමාවේ රක්ෂස්ථාන වූයේය. වන්දනාකරුවන් වැඩිවූයෙන් ගලෙන් තනා උළු සෙවිලි කරන ලද දෙව් මැදුරක් ඇති විය."*
( එඩ්මන්ඩ් පීරිස් රදගුරුතුමා,  1950, 40 පිට )






3

# සන්තානාදීපයේ අද දවස

කල්පිටිය අර්ධද්වීපය වර්තමානයේ තේතාපොළ, තලවිල, කුරිසද්සඳම්පිටිය හා කල්පිටිය යනුවෙන් මිසම් හතරකට බෙදා වෙන්කර ඇත. මෙම මිසම් හතරට අයත් මුළු දෙව්මැදුරු ගණන 24ක් පමණ වේ. එක් එක් මිසම තුළ ඇති දේවස්ථානවල නාමයන් මෙසේය.

**තේතාපොළ මිසම**

ශා. විසෙන්ති පාවුලා දෙව්මැදුර - කරඹ
ශා. සෙබස්තියන් දෙව්මැදුර - තේතාපොළ
මඩුමාතා දෙව්මැදුර - මැල්කොළණිය
ශා. අන්තෝනි දෙව්මැදුර -දලුව
සින්දාත්‍රි දේවමාතා දෙව්මැදුර - නාවක්කඩුව
ජපමාලමාතා දෙව්මැදුර - මාම්පුරිය
ශා. ප්‍රන්සිස් සේවියර් දෙව්මැදුර - මාම්පුරිය
ශා. සෙබස්තියන් දෙව්මැදුර - නාරක්කල්ලිය
ශා. ජුසේ දෙව්මැදුර - පනිආඩිය



ශා. අන්තෝනි දේවස්ථානය දලුව
මෙහි මුල් දේවස්ථානය 1884 වර්ෂයේ ගොඩනගා
ඇති අතරවර්තමාන දේවස්ථාන ගොඩනැගිල්ල
1988 වර්ෂයේදී ඉදිකරන ලද්දකි

**තලවිල මිසම**

දිව්‍ය හෘදයේ දේවස්ථානය - තොරොච්චෝලේ
ආරෝග්‍යමාතා දේවස්ථානය - ඉලන්තිඅඩිය
ශා. සෙබස්තියන් දේවස්ථානය - ආලන්කුඩාව
වේලන්කන්නිමාතා දේවස්ථානය - ආන්ඩන්කන්ඩිය
ශා. අන්තෝනි දෙව්මැදුර - ඒත්තාලේ
ශා. ආනා සිද්ධස්ථානය - තලවිල
ශා. අන්තෝනි සිද්ධස්ථානය - කැලේ පල්ලිය
ශා. පාවුළු දේවස්ථානය - පාලකුඩාව

කල්පිටිය අර්ධද්වීපය හා ඒ අවට දූපත් තුළ පිහිටා ඇති සියලු දේවාලයන් අතරින් ප්‍රධානතම දේවාලය ලෙසින් තලවිල ශාන්ත ආනා සිද්ධස්ථානය හැඳින්විය හැකි වුවත්, ඓතිහාසික හා වාස්තු විද්‍යාත්මක වටිනාකම් වලින් පොහොසත් වූ තවත් දේවාලයන් සමූහයක් මෙම ප්‍රදේශය පුරා පිහිටා ඇති බව පෙනේ. විවිධ සමාජීය හා ආර්ථික විපර්යාස වලට මුහුණදෙමින් ඉදිරියට පැමිණි මෙම දේවාලයන් බොහොමයක් වර්තමානයේ නොයෙකුත් ප්‍රතිසංස්කරණයන්ට හා අලුත්වැඩියා කිරීම් වලට ලක්ව ඒවායේ මුල් ස්වරූපයෙන් යම්තාක් දුරට ඈත් වී තිබේ.

ප්‍රදේශයේ සැදැහැවතුන්ගේ සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩිවීමත් සමග දේවාලයන් ඇතුළත ඉඩකඩ ප්‍රමාණවත් නොවීමේ ගැටලුව සඳහා ජනතාවට එකවර ආගමික වතාවත්වල යෙදීමට පහසුවන පරිදි දේවාලයේ ඉදිරිපස මුහුණතට යාබදව එළිමහන් මණ්ඩප ඉදිකර ඇත. ඉඩකඩ මදවීමේ ගැටලුව සඳහා මෙම එළිමහන් මණ්ඩප ප්‍රායෝගික පිළියමක් වුවත්, එමගින් මුල් ගොඩනැගිල්ලේ වාස්තු විද්‍යාත්මක හා කලාත්මක බවට යම්තාක් දුරට බලපෑමක් එල්ල වී තිබේ. එනමුදු එය ප්‍රදේශයේ ජනතාවගේ එකමුතුකමේ හා පරිත්‍යාගශීලීභාවයේ ලකුණකි. ඔවුන් විසින් ශත වර්ෂ ගණනක් මුළුල්ලේ රැකගත් කිතුනු විශ්වාසයේ හා ඇදහීමේ භෞතික සංකේතයක් වූ මෙම දේවස්ථාන සුරැකීම අද දවසේ අප සැමගේ යුතුකමක් වන්නේය.

# පරිශීලිත ග්‍රන්ථ

## සිංහල


ආරියරත්න, ඇස්., 1987. *කැරොලිස් පසන් කතෝසාරු.* කොළඹ: සී/ස සුපසන් අධ්‍යාපන සේවා සමාගම

ආරියරත්න, ඇස්., 1993. *ජාකොම් ගොන්සාල්වේස් තෝරාගත් කෘති.* කොළඹ: සමාජ-සංස්කෘතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

බලගල්ල, ජේ., 2011. *සමිඳු මගේ පියවරෙන් පියවර.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

බණ්ඩාර, ටී. එම්. සී., 2005. *පෞරාණික ස්ථාන හා ස්මාරක පුත්තලම් දිස්ත්‍රික්කය.* කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

දොන් පීටර්, ඩබ්ලිව්. එල්. ඒ., 1991. *අසහාය ධර්මදූතවරයාණෝ.* ජා-ඇල: දහම් සරණ ආයතනය

දොන් පීටර්, ඩබ්ලිව්. එල්. ඒ., 1992. *බොන්ජීන් අගරදගුරු.* ජා-ඇල: දහම් සරණ ආයතනය

ප්‍රැන්සිස්, ජේ., බොල්ලැගල, එම්., සහ ප්‍රනාන්දු, එස්. ජී., 2007. *අගරදගුරු පදවි දැරීමිතුරු පුරාණය.* කොළඹ: කොළඹ කතෝලික මුද්‍රණාලය

ගෝම්ස්, ඕ., 2009. *ශ්‍රී ලංකාවේ කිතුනු දායකත්වය.* කොළඹ: කතෝලික ප්‍රකාශන කේන්ද්‍රය

ගෝම්ස්, ඕ., 2012. *කතෝලික පරිශියාව (ශ්‍රී ලංකාව).* කොළඹ: කතෝලික ප්‍රකාශන කේන්ද්‍රය

ජෝෂප්, ඕ., (සංස්කරණය) 1995. *වදා-මෝදරතුර දෙමිතුල් මහෝත්සවය.* කොළඹ: රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

කොලම්බුන්නේ, ටී., 1985. *සිරිලක් කිතු සසුන පළමු කාණ්ඩය.* රාගම: සාරංගා මුද්‍රණාලය

කොලම්බුන්නේ, ටී., 2009. *සිරිලක් කිතු සසුන දෙවන කාණ්ඩය.* රාගම: සාරංගා මුද්‍රණාලය

කුරුකුලාරච්චි, එල්., 1990. *සලාතුර පදවි ඉතිහාසය.* :

නෝනිස්, එච්., 1993. *ඉපැරණි තලවිල පුදබිම.* තලවිල: තලවිල ශා. ආනා සිද්ධස්ථානය

පීරිස්, ඊ., 2012. *තලවිල ශාන්ත අනා මෑණියෝ*. තලවිල: ශා. අනා සිද්ධස්ථානය

රොහාන්, වී., 2009. *ලාංකේය සාන්ත දුක්ඛප්‍රාප්ති නාට්‍යයේ ඉතිහාසය, ආකෘතිය හා සාහිත්‍යය*. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ

සිල්වා, එන්. ද. සහ දිසානායක, එම්., (පරිවර්තනය) 1994, *ජුසේවාස් පියතුමාගේ ලංකීය ධර්මදූත මෙහෙය*. කොළඹ: ඩෙවෙකෝ ඩිසයින(ර්)ස් ඇන්ඩ් පබ්ලිෂ(ර්)ස්

සෝමරත්න, ජී. පී. වී., 2011, *ශ්‍රී ලංකාවේ ක්‍රිස්තු සභා ඉතිහාසය 1800 දක්වා*. කොළඹ: කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය

## English

Fernandes, I. P. N., 1994. *St. Francis Xavier & Old Goa*. Goa: Koinia Publication

Nelson,W. A., 1984. *The Dutch Forts of Sri Lanka The Military Monuments of Ceylon*. Edinburgh: Anon

Perera, A., 1922. *The History of St. Anne's Church Thalawila*. Kaluthara: St. Vincent's Prints

Perera, S. G., 1941. *The Jesuits in Ceylon - In the XVI and XVII Centuries*. New Dilhi: Asian Educational Service

Perera, S. G., 1947. *Life of Blessed Joseph Vas Apostle of Sri Lanka*. Kandy: Fine Graphic

Perniola, V., 2005. *The Catholic Church in Sri Lanka The Dutch Period, Volume I*. Dehiwala: Tisara Prakashakayo

Perniola, V., 1992. *The Catholic Church in Sri Lanka The British Period, Volume I*. Dehiwala: Tisara Prakashakayo

Perniola, V., 1995. *The Catholic Church in Sri Lanka The British Period, Volume II*. Dehiwala: Tisara Prakashakayo

Silva, R. K. D. and Benmer,W. G. M., 1988. *Illustrations and Views of Dutch Ceylon 1602-1796*. London: Serendib Publication